**පිටබැද්දර ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ආයෝජන ගිණුමේ රු.359,589 ක් වැඩියෙන්ද ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.2,602,900 ක් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ස්ථාවර තැන්පත් ගිණුම් 02 ක් වෙනුවෙන් ලැබිය යුතු පොලී රු.360,206 ක් හා උප පත්‍රිකා තොගයේ වටිනාකම රු.52,434 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කරන ලද රු.846,189 ක ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමාලෝචිත වර්ෂය අවසානයේ ජර්නල් සටහන් මඟින් ඉවත් කිරීමේදී එම මුදල පොදු ගබඩා තොගයට සමුච්චිත අරමුදලට ගැලපීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම් ගත වී තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ඉන්වෙන්ට්‍රි ස්වරූපයේ රු.255,903 ක් වටිනා අයිතම 132 ක් ලී බඩු හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ගබඩාවට රාක්ක සකස් කිරීම සඳහා වැයකරන ලද රු.511,192 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ඉදිකිරීම් කර්මාන්ත 02 ක් වෙනුවෙන් ලැබිය යුතු/ ගෙවිය යුතු මුදල රු.194,957 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.381,087 ක වෙනසක් පැවතිණි. | 2024 වර්ෂයේදී නිවැරදි කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.14,922,052 ක් වූ ගිණුම් විෂයයන් 13 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | 2024 වර්ෂයේදී ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මු.රෙ. 571 | රු.950,391 ක් වූ කල් ඉකුත් වූ පොදු තැන්පත් ශේෂ 43 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.14,159,614 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.19,640,754 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුග ත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,696,000 | 1,763,365 | 2,564,981 | 898,713 | 1,687,000 | 1,500,829 | 1,700,085 | 1,700,329 |
| කුලී | 23,048,240 | 17,098,748 | 16,848,183 | 2,959,362 | 23,053,480 | 18,802,283 | 18,542,216 | 2,708,797 |
| බලපත්‍ර ගාස්තු | 1,155,100 | 1,182,576 | 1,147,176 | 106,922 | 1,155,100 | 1,525,768 | 1,525,768 | 71,522 |
| වෙනත් ආදායම් | 2,846,500 | 5,051,973 | 4,899,596 | 409,383 | 4,246,500 | 1,318,150 | 1,480,786 | 257,006 |
| එකතුව | 28,745,840 | 25,096,662 | 25,459,936 | 4,374,380 | 30,142,080 | 23,147,030 | 23,248,855 | 4,737,654 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට අක්කර බදු රු.317,993 ක හිඟ ශේෂයක් පැවති අතර ඉන් රු.309,006 ක ශේෂ දීර්ඝ කාලයක් තිස්සේ අය නොවී පැවතුනි. | රු.309,006 ක දීර්ඝ කාලීන හිඟ මුදල කපා හැරීමට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත 2024 අප්‍රේල් 26 දින ලිපියක් යොමු කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ආ) | හිඟ කසල බදු අදායම රු.468,760 ක් වූ අතර ඉන් රු. 274,160 ක් වර්ෂ 03 ඉක්මවූ ශේෂ විය. | අය නොවූ ඉතිරිය 2024 වර්ෂයේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඇ) | සභාව සතු ස්ථාන 11 ක තිබූ කඩ කාමර 121 න් 109 ක් බදු දී තිබූ අතර, ඉන් කඩ කාමර 74 කින් රු.2,181,979 ක කඩ කුලී අයවීමට තිබුණි. | අය නොවූ ඉතිරිය 2024 වර්ෂයේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බදු දී තිබූ කඩ කාමර 18 කට අදාලව ගිවිසුම් කල් ඉකුත් වී වර්ෂ 01 ත් 23 ත් අතර කාලයක් ගත වී ඇතත් එම ගිවිසුම් යාවත්කාලීන කිරීමට හෝ සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩකාමර 24 කට අදාලව ගිවිසුම් කල් ඉකුත් වී ඇති බවත්, හිඟ පැවති කඩ කාමර 19 කට නඩු පවරා ඇති බවත්, කඩකාමර 03 කට නඩු පැවරීමට නියමිත බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,049,598 ක් හා මුද්දර ගාස්තු රු.17,469,691 ක් විය. | 2024 අප්‍රේල් මස අවසාන වන විට මුද්දර ගාස්තු රු.10,173,842 ක් හා උසාවි දඩ රු.1,049,598 ක් අය කර ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා වනසිංහ කන්ද ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි හෙක්. 8.43 ක ප්‍රමාණයකින් යුතු භූමි කොටසක් 2013 වර්ෂයේදී සභාව වෙත පවරා ගෙන 2015 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන පිළිසරු ව්‍යාපෘතිය සමඟ ගිවිසුම්ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘති කටයුතු ආරම්භ කර නොතිබුණි. | කොම්පෝස්ට් අංගනයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කිරීමට ඇති බව. | විධිමත් කසළ කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සියළුම පළාත් පාලන ආයතන විසින් මහජනයා වෙත ලබා දෙන සේවා පහසු කිරීම, කාර්යක්ෂම කිරීම සහ ආදායම් කඩිනමින් එක්රැස් කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේද හඳුන්වාදීම අනිවාර්ය වුවත් සභාව සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර ගෙවීම් පහසුකම් සැලසීමට කටයුතු කර නොතිබුණි. | වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයකු පත්කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 වර්ෂයේ දී රු.167,750 ක් වැය කර සභා භූමියෙහි ඉදිකර තිබූ ජීවවායු ඒකකයෙන් නිපදවෙන ජීවවායු ප්‍රමාණය දෛනිකව පරිභෝජනය නොවන අතර එහි ක්‍රියාකාරිත්වය හා පරිභෝජනය උපරිම කිරීමට සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | වර්තමානයේ පරිභෝජනයට ගන්නා බව. | ක්‍රියාකාරිත්වය හා පරිභෝජනය උපරිම කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ නාගරික සීමාව තුළ සංවර්ධන බලපත්‍රයක් නොමැතිව ගොඩනැගිලි 05 ක් ඉදිකරමින් පැවැති අතර ඒ සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2024 මැයි 08 දින පැවති සැලසුම් කමිටුවේදී ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කරන ලද බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂය තුළ පස් කපා සංවර්ධනය කර තිබූ මාර්ග 07 ක හියුම් පයිප්ප යෙදීම සඳහා රු.690,593 ක් ගෙවා තිබූ අතර ඒ සඳහා නියමිත රේටයන් භාවිතා නොකිරීම නිසා කොන්ත්‍රාත්කරුට රු.171,584 ක් වැඩිපුර ගෙවා තිබුණි. | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හියුම් පයිප්ප ඇතිරීම සඳහා හඳුන්වා දී ඇති ST-068, ST-069, ST-070 හා ST-071 යන රේටයන්ට පස් කැනීම, හියුම් පයිප්ප ප්‍රවාහනය,හියුම් පයිප්ප පැටවීම හා බෑම, හියුම් පයිප්ප ඇතිරීමෙන් අනතුරුව නැවත පස් දමා තැලීම යනාදිය ඇතුළත් නොවන බවත්, දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේ පළමු භාගයේ රේට භාවිතා කර ඇස්තමේන්තු හා බිල්පත් සකස් කර ගෙවීම් කිරීමේ දී ඉහත කාර්යයන් 04 සඳහා වෙනම ගෙවීමක් සිදු කර නොමැති බව. | නියමිත රේටයන් භාවිතා කළ යුතුය. |
| (ආ) | PC-30 වර්ගයේ එක්ස්කැවේටර් යන්ත්‍ර භාවිතා කර මාර්ග 04 ක මාර්ගය දෙපස කාණු සකස් කිරීම සඳහා ගෙවීම් කිරීමේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී තිබූ DR-005A රේටය වෙනුවට මිනිස් ශ්‍රමය භාවිතා කර එම කාර්යය ඉටු කිරීම සඳහා හඳුන්වා දී තිබූ DR-001 රේටය භාවිතා කර තිබීම නිසා කොන්ත්‍රාත්කරුවන්ට රු.91,091 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | විරසේකර කන්ද මාර්ගය, අළුවන කන්ද මාර්ගය, වටදෙනිවල මාර්ගය යන මාර්ගයන්ගේ කාණු සැකසීම මිනිස් ශ්‍රමයෙන් සිදු කර ඇති බවත්, වනසිංකන්ද හරහා සියඹලාගොඩ මාර්ගයේ පළලින් වැඩි ස්ථානවල පමණක් කාණුව සැකසීමේදී හා මාර්ගය මට්ටම් කිරීම සඳහා PC-30 වර්ගයේ එස්කැවේටර් යන්ත්‍රයක් භාවිතා කර ඉතිරි ප්‍රමාණයන් මිනිස් ශ්‍රමය මගින් සිදුකර ඇති බව. | නියමිත රේටයන් භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාවේ ඉදිරිපස ආරක්ෂිත දොර සකස් කිරීමේ කර්මාන්තයට අදාලව Powder Coated ඇලුමිනියම් යොදා දොර රාමු හා ලූවර් සකස් කිරීම වෙනුවට Aluminum Bronze Anodized ඇළුමිනියම් රාමු යොදා අදාල කාර්යය නිම කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු.224,704 ක් ගෙවීම් කර තිබුණි. | Powder coated Aluminum වෙනුවෙන් ගෙවූ රු.224,704.30 ක මුදලත්, Aluminum Bronze Anodized වෙනුවෙන් ගෙවිය යුතු රු.212,472.43 ක මුදලත් අතර වෙනස ලෙස වැඩිපුර ගෙවා ඇති රු.12,232 ක මුදල රැඳවුම් මුදලින් අඩු කර ගෙවීමට කටයුතු කරන බව. | නිවැරදි රේටයන් භාවිතා කළ යුතුය. |
| (ඈ) | සභාවේ වාහන සේදුම් අංගනයෙහි වහල ඉදිකිරීමේ කර්මාන්තයේ වැඩ විස්තරය ප්‍රකාරව දැව ආලේපය සිදුකර නොතිබියදී එය සැකසීම වෙනුවෙන් රු.222,689 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | මෙම කර්මාන්තයට අදාල රැඳවුම් මුදල් නිදහස් කර නොමැති බැවින් කොන්ත්‍රාත්කරු ලවා දැව ආරක්ෂක ආලේප කිරීමෙන් අනතුරුව රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බව. | ඉටු කළ වැඩ කොටස් සඳහා පමණක් ගෙවීම් කළ යුතුය. |
| (ඉ) | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ ඉහළ මහලෙහි ඉදිකිරීම් සඳහා 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අවස්ථා 08 කදී රු.12,474,726 ක් වටිනා ඇස්තමේන්තු සකස් කර රු.10,936,007 ක ගිවිසුම්ගත මුදලකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු හා අනුමත සමිති වෙත කොන්ත්‍රාත් පිරිනමා තිබුණ ද ගොඩනැගිල්ලේ ඉහළ මහලෙහි සියළු වැඩ ආවරණය වන සේ ඉදිකිරීම් සැලසුම් කර මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර, පවතින ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන, ඉටුකළ යුතු වැඩ ප්‍රමුඛතාවය හඳුනාගෙන ඉදිකිරීම් සිදු නොකිරීම නිසා 2024 ජනවාරි 24 දින වන විටත් ඉහළ මහලෙහි ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව. | සියළු කාර්යයන් හඳුනාගෙන මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර කොන්ත්‍රාත් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | ----------------------- | ------------ |
| (අ) | සභාවේ සේවය කර 2011 වර්ෂයත් 2023 වර්ෂයත් අතර කාලසීමාව ඇතුළත විශ්‍රාම ගිය හා සේවය හැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.111,313 ක් වූ ණය ශේෂ අය නොවී පැවතුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවේ සේවයේ නියුතු ප්‍රාථමික ශ්‍රේණියේ කම්කරුවන් 12 දෙනෙකුට තනතුරට අදාල නොවන රාජකාරි පවරා සමාලෝචිත වර්ෂය තුළ දී වැටුප් ලෙස රු.5,464,122 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | සේවා අවශ්‍යතා මත රාජකාරි පවරා ඇති බව. | තනතුරට අදාල රාජකාරී පැවරිය යුතුය. |